Journal of Intangible Cultural Heritage

JICH (2025), Volume 4 (II)

# A Sustainable Environmental Development Perspective in Low-Country Rituals

## පහතරට ශාන්තිකර්මවල තිරසර පරිසර සංවර්ධන දෘෂ්ටි කෝණය පිළිබඳ අධ්‍යයනය

D. P. R. Peiris

Department of Low-Country Dance, University of the Visual and Performing Arts, Sri Lanka
*rohanadp1234@gmail.com

**_Abstract_**

*It must be acknowledged that there has been a unique bond between humans and the environment since the beginning of civilization. Among these, human perception of environmental sustainability is very important. Among the economic, political, and social phenomena that influence it, cultural ideologies are particularly significant. In seeking solutions, the low country rituals were identified as expressions of the folk mind of Sri Lankan culture. The research question was whether the eco-friendly practices of these rituals have an impact on the environment. The study focused on the cultural rules related to the environment in the tree, water, and land rituals of the low country sanniyakuma, suniyam kapima, madushanthikarma, and bali shanthikarma, which were limited in scope. It is assumed that the origin of these cultural norms is expressed through religious ideologies. Attitudes based on human environmental knowledge and beliefs were examined. The qualitative research methodology used was the anthropological method, with low country ritual observation and participant observation considered primary sources of data collection. Meanwhile, ritual literature, as well as the study of human–environment relations, were used as secondary resources. Cultural practices such as nawakola aththa, millakapima, kap situveema, aththagahamathireema, nanumuraya, diyakeliya, kahadiyara kannalawwa, and bahirawa pooja, which were the objectives of the research, were observed. Accordingly, the practices studied confirm that humanistic attitudes and values toward the environment have had a beneficial effect on environmental democracy. It was also observed that eco-cultural norms are based on both human empirical understanding and belief systems about the environment.*

***Key Words:*** *Environmental Worship, Sustainable Environment, Environmental Attitudes, Tree Worship, Water Worship*

## 1. හැඳින්වීම

ශිෂ්ටාචාර ආරම්භයේ සිට මානවයා සහ පරිසරය අතර ඒකාත්මික බැඳීමක් පැවැති බව පිළිගත යුත්තකි. මානවයාගේ පරිසරය පිළිබඳ සමාජීය හැසිරීම්වල තීරණාත්මක සාධකය වූයේ ඔහුගේ පංචේන්ද්‍රිය සහ මනසෙහි අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය ඒ කෙරෙහි ගොඩනැගුණු සංජානනය යි. ඒ අනුව පරිසරයේ ඇති විවිධ වස්තු මෙන්ම සංසිද්ධි පිළිබඳ කියැවීම, දැනුම්වත් වීම, අර්ථ දැක්වීම පරිසර සංජානනය ලෙස අර්ථ දැක්වේ. එකී පාරිසරික සංජානනය මත බිහිවන සංවේදන ප්‍රකාශන ක්‍රියාවලියක් ලෙස සංස්කෘතික රීති හඳුනාගන්නට විය. එමෙන් ම පරිසරය හා මිනිසා අතර අන්තර් සම්බන්ධතා මත ගොඩනැගෙන පරිසර සාරධර්ම, ආකල්ප ප්‍රභවයට විශ්වාස මඟ පෙන්වන බව දැක්වේ. ඒ කෙරෙහි බලපවත්වන ආර්ථික, දේශපාලන, සමාජ ප්‍රපංච අතුරින් සංස්කෘතික දෘෂ්ටිවාද මෙහි දී අවධානයට ලක් කෙරේ. අතීත මානවයාගේ පරිසර කේන්ද්‍රීය සංස්කෘතික ජීවිතය අද්‍යතනයේ අනෝමීයත්වය මත දුරස්ථව ඇත. ඒ කෙරෙහි පුද්ගලවාදී ආර්ථික බලාධිකාරිය හේතුවෙන් සංස්කෘතික හරණයේ බලපෑම මෙරට පරිසර පද්ධති විනාශයටද හේතු විය. ඊට විසඳුම් සෙවීමේ දී ලාංකේය සංස්කෘතියේ ජන විඥානගත ප්‍රකාශන අතුරින් පහතරට ශාන්තිකර්ම වත්පිළිවෙත් හඳුනාගන්නට විය. ඒ අතුරින් පරිසර බද්ධ වත්පිළිවෙත් මඟින් පරිසර පැවැත්ම කෙරෙහි පිටිවහලක් සිදු වන්නේ දැයි විමසුම මෙහි පර්යේෂණ ගැටලුව ලෙස සලකන ලදි. ඒ කෙරෙහි ශාන්තිකර්ම පද්ධතියෙහි සංස්කෘතික දෘෂ්ටිවාද, විශ්වාස, චාරිත්‍ර-වාරිත්‍ර පරිසර විෂය මූලික සදාචාරාත්මක වටිනාකම් ගවේශණය කරයි. එහි දී විෂය සීමා වූ පහතරට සන්නියකුම, සූනියම් කැපීම, මඩු ශාන්තිකර්ම හා බලි ශාන්තිකර්මවල වෘක්ෂ, ජලය හා භූමිය උදෙසා සිදු කෙරෙන පරිසරානුබද්ධ සංස්කෘතික රීති විමසීම මෙන් ම එමඟින් තිරසර පරිසරය උදෙසා උපස්ථම්භකවන ආකාරය සොයාබැලීම ද අධ්‍යයනයේ අරමුණු වෙයි.

පරිසරයට සංවේදී මානසිකත්වයක් ගොඩනැඟීමට ඉවහල් වන පරිසරය හා බැඳුණු ආගමික විශ්වාස පිළිබිඹුවන ශාන්තිකර්ම උපත් කතා, පුරා කතා ආදී ජනශ්‍රැති ආශ්‍රය කෙරේ. එමඟින් මිනිසා හා පරිසරය අතර සෞන්දර්යාත්මක, ආගමික සබැඳියාවක් ගොඩනැඟීමෙන් පරිසරයට මානවවාදී ආකල්ප ප්‍රතිබද්ධ වනු ඇත. අධ්‍යයනයේ ගැටලුව හා අරමුණු පාදක වූ කෘති, සඟරා, වාර්තා, අත්පිටපත්, පුස්කොළ පොත් හා වෙනත් සාහිත්‍ය පරිශීලනය කළ අතර, එහි දී පරිසරය හා මිනිසා, පරිසර ගැටලු, පරිසර වන්දනා, පරිසර අණ පනත්, පහතරට ශාන්තිකර්ම ආදී මාතෘකා මූලික සාහිත්‍යය විමසීය. එමඟින් මානව ශිෂ්ටාචාර ආරම්භයේ සිට පරිසරානුබද්ධ සංස්කෘතික රීති පහතරට ශාන්තිකර්ම වත්පිළිවෙත් දක්වා විකාශය වූ ආකාරය විමසා බැලීය. පසුකාලීන මධ්‍යතන යුගයේ විද්‍යා පුනර්ජීවනයේ ප්‍රතිඵල මත ආගමික ඇදහිලි විශ්වාස ආදිය සමාජ, මානව හා දර්ශන ආදී විෂයානුබද්ධ පර්යේෂණ කෘති පරිශීලනය කෙරීය. එමඟින් පරිසර ගැටලු කෙරෙහි බලපවත්වන අනෝමීයත්වය, ජීවවාසික භීතිකා, ධනවාදී නිෂ්පාදන ප්‍රකාර මූලික වූ ආර්ථික, දේශපාලන සහ සමාජ මතවාද බලපා ඇති ආකාරය පැහැදිලි ය. එමෙන් ම පර්යේෂණ මාතෘකාවට සෘජු සබඳතාවක් නොවුන ද පරිසරානුබද්ධ මානව සබඳතා පිළිබඳ විමසුමේ දී භෞතික භූගෝලීය හා මානුෂ භූගෝලීය විද්‍යා කෘති පරිශීලනය වැදගත් විය. එසේම මෙරට ජනයාගේ පරිසරානුබද්ධ දැනුම, ආකල්ප විමසුමේ දී ඒ හා බැඳී ජන සාහිත්‍ය වැදගත් බව පසක් කෙරේ.

පරිසර සුරක්ෂිතතාව අරමුණු කොට ලෝකයේ බොහෝ සංවිධාන හා රටවල් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එහි දී මානව ගුණධර්ම කෙරෙහි ද අවධානය යොමුව තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය මෙරට සංස්කෘතික හරපද්ධතීන්ට අනුව පරිසරය අනුබද්ධ ඇදහිලි විශ්වාස මූලික ව ස්වභාවධර්මයේ පැවැත්ම වෙනුවෙන් සිදු කරන පර්යේෂණයක් ලෙස බොහෝ වැදගත් වනු ඇත. එමෙන් ම එකී විශ්වාස නිරීක්ෂණයෙන් අතීත මානවයාගේ පරිසරය පිළිබඳ දැනුම, අවබෝධය ඔවුන්ගේ ජන ජීවිතය සඳහා කෙතරම් ඉවහල් කොට ඇත්දැයි පැහැදිලි වෙයි. එසේ වුවද අද්‍යතන සමාජය ස්වභාවධර්මයේ පැවැත්ම වටිනාකම පිළිබඳ අනවබෝධය හෝ විපරිත වූ සමාජ ආර්ථික තත්ත්ව මත හෝ ඒ පිළිබඳ නොසලකා හැර ඇත. එහෙත් මෙම විමර්ශනය මඟින් නූතන මිනිසාට අන්තර් විෂය ප්‍රවේශයක් හරහා ඒ පිළිබඳ තවදුරටත් සිතා බැලීමට අවධාරණය

කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනය මඟින් ඉදිරිපත් කෙරෙන කරුණු විෂයානුබද්ධ පර්යේෂකයින්, විද්‍යාර්ථීන්, සාහිත්‍යධරයන්, පරිසරවේදීන් ඇතුළු සමස්ත පාඨකයන්ට තම ඥාන සම්භාරය පුළුල් කර ගැනීමට උපකාර වන බව නිරනුමාන ය. එමෙන් ම පොදු ජනයා තුළින් ගිලිහෙමින් පවතින පරිසරානුබද්ධ සබඳතා වර්ධනය කිරීමටත් පරිසර හිතකාමී සංස්කෘතියක් ගොඩනැඟීම උදෙසාත් අවැසි සාරධර්ම ගොඩනැඟීමට ඉවහල් කොට ගත හැකි ය. ඒ අතර පරිසර සංවර්ධන විෂයෙහි ප්‍රතිපත්ති සම්පාදකයන්ට ද, පරිසරයට සංවේදී මානවවාදී ගුණධර්ම ප්‍රතිවර්තනය සඳහා පාසල් විෂයෙහිලා දායක කිරීමටද, වැදගත් වන බව කිව යුතු ය.

**අධ්‍යයනයේ සංකල්ප විග්‍රහය**

පර්යේෂණ මාතෘකාව හැඳින්වීමේ දී අධ්‍යයන ප්‍රවේශය ලෙස තේමා විශ්ලේෂණ ක්‍රමවේදයක් සකසා ගැනීම අවශ්‍ය වෙයි. පරිසරය හා තදනුබද්ධ පහතරට ඇදහිලි විශ්වාස පිළිබඳ අධ්‍යයනයේ දී පරිසරය, මිනිසා, ඇදහිලි, විශ්වාස, ආගම, පහතරට ශාන්තිකර්ම ආදිය අර්ථාන්විත භාවිතය විශ්ලේෂණය කළ යුතු ය. ඒ අනුව පර්යේෂණ මාතෘකාව හැඳින්වීම විශේෂ න්‍යායික පද්ධති තුනක් ලෙස ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අතුරින් තුන්වන අනුමාතෘකාව අධ්‍යයනයේ ප්‍රතිඵල හා සාකච්ඡාව යටතේ සිදුවේ.

1.1 පරිසරය හා මිනිසා අතර පවත්නා අන්තර් සම්බන්ධතා
1.2 පරිසරය හා බැඳි ඇදහිලි විශ්වාස ප්‍රභවය හා විකාශය
1.3 පහතරට ශාන්තිකර්මවල පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාස

**1.1 පරිසරය හා මිනිසා අතර පවත්නා අන්තර් සම්බන්ධතා**

පරිසරය ලොව ජීව අජීව සියලු දෙයකින්ම සමන්විත සංකීර්ණ පද්ධතියකි. පරිසරයෙන් තොරව මිනිසාගේ පැවැත්ම විග්‍රහය කළ නොහැකි ය. ඒ අතර පාරිසරික සමතුලිතතාව හා මිනිසා අතර ඇති අන්තර් සම්බන්ධතා ද පිළිගත යුත්තකි (තිස්ස හිමි, 2002: 693). අප අවට පරිසරය ලෝකය, වටපිටාව, ස්වභාව, ලෝක ස්වභාව, සොබාදහම හා ස්වභාවධර්මය යනාදිය විවිධාකාරව භාවිතයේ පවතියි. ඒ අතුරින් ''ස්වභාව'' යන්නෙහි නිරුක්ති ලෙස දැක්වෙනුයේ ගතිය, ආකාරය, සැටිය (ශ්‍රී රේවත , 2001, 699) වශයෙන් ද, ''ස්ව+භාව'' යන්නෙන් තමාගෙ සැටිය (අදිකාරම්, 1975: 283) යනුවෙන් ද දැක්වේ. මේ අනුව ස්වභාව පරිසරයෙහි ව්‍යවහාරය අප අවට පරිසරයේ සැකැස්ම, ආකාරය, විධිය අර්ථ ගම්‍යවන බව පැහැදිලි ය. ඒ අතර පරිසරය මිනිසාගේ මැදිහත්වීම මූලික ව සැකසෙන්නක් බවත්, පරිසරය ජීව අජීව සියල්ලගෙන් යුක්තවීම ස්වාභාවික යන අර්ථය ද එහි සංයුක්ත බව අවබෝධ කරගත හැකි ය. ඒ අනුව ''ස්වාභාවික'' යෙදුම විමසීමේ දී ස්වභාවයෙන් හටගන්නා දේ, ධර්ම ස්වභාව, ශක්ති වන දේ, ඉබේටම සිදු වන දේ, ජරා මරණ, බඩගිනි, නිදිමත, ගල් ලියරුක්වල අදාළ කාලයෙහි මල් ගෙඩි හටගැණීම ආදි ස්වාභාවිකව හටගන්නා දේ යනුවෙන් අරුත් වෙයි (ශ්‍රී රේවත, 2001: 700). ඒ අතර පරිසරය යන්නට ස්වභාව ධර්මය සමානාර්ථයෙන් භාවිතයේ දී ''ධම්ම-ධර්ම'' යෙදුම් පරිසර විෂය හා සබඳතාව ස්වභාව, ඥනය, යුක්තිය, සත්‍ය, ප්‍රකෘතිය, දැනගත යුතු දේ, ගුණ, ආචාර, සමාධි, නිස්සත් බව, ආපත්ති, හේතු, ආත්මය, ජීවය, න්‍යාය (ශ්‍රී රේවත, 2001, 382-983) යනුවෙන් අරුත් ගැන්වෙයි. උක්ත අර්ථ විග්‍රහ අධ්‍යයනයෙන් ගම්‍ය වනුයේ පරිසරය කෙරෙහි මිනිසා විසින් ගොඩනඟා ගත යුතු අවබෝධය, ධර්මතා, ආකල්ප ආදි ලක්ෂණවලින් පරිපූර්ණ විය යුත්තක් බව ය. ඒ අනුව පරිසරය හා මිනිසා අතර පවත්නා භෞතික හා අභෞතික සබඳතා අතුරින් පරිසරයේත් මිනිසාගේත් යහපැවැත්ම කෙරෙහි බලපාන්නා වූ අභෞතික සම්බන්ධතා විමසුමට වැඩි අවධානයක් යොමු විය. පූර්වෝක්ත අර්ථ විග්‍රහයට අනුව පරිසරය, සොබාදහම, ස්වභාව ධර්මය සමානාර්ථ වචන ලෙස සලකා මෙම අධ්‍යයනයේ දී ව්‍යවහාර කෙරේ.

ප්‍රාථමික මානවයා තම ජීවිතයට බද්ධ මූලික අවශ්‍යතා කෙරෙහි පමණක් අවධානය යොමු විය. එහි දී ඉර, හඳ, තාරකා, අව්ව, වැස්ස, හෙණ හඬ, ගංගා, ගස්, ගල්, පර්වත ආදි ක්‍රියාවන් හා

වස්තූන් අවධානයට ලක්ව ඇත. එමෙන් ම වෘක්ෂ, ජලය, භූමිය උපයෝගයෙන් ආහාර, වස්ත්‍ර, නිවාස, ඖෂධ, ආරක්ෂාව ආදි මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට ද පරිසරය පිළිබඳ අවබෝධයක් තිබූ බව හඳුනාගන්නට විය (පල්ලියගුරු, 2000: 536). ඉක්බිතිව මානව ශිෂ්ටාචාර බිහි වීමත් සමඟ පරිසරය පිළිබඳ දැනුම ක්‍රමයෙන් පුළුල් වූ අතර එය මානව උන්නතිය උදෙසා බෙහෙවින් ඉවහල් වන්නට ඇත. එකී මානවයා සොබාදහම සමග පැවති සබඳතා හා අවබෝධය ප්‍රංශයේ ලැස්කෝ ගුහා චිත්‍ර මගින් අනාවරණය කරගත හැකි ය (විජේරත්න, 1998: 6). ඒ අනුව ක්‍රමයෙන් ඊජිප්තු - නයිල්, මෙසපොතේමියාව යුප්‍රටීස්-ටයිග්‍රීස්, ඉන්දුනිම්නයේ ඉන්දු, චීනයේ කහ ගඟ ආදි ශිෂ්ටාචාර ගංගා නිම්න ආශ්‍රිත ව පිහිටුවීම මිනිසා පරිසරය පිළිබඳ ගොඩනගා ගත් දැනුම මෙහිලා වැදගත් වේ. එපමණක් නොව ශ්‍රී ලංකාවේ ද ජජ්ජර නදී (දැදුරු ඔය), මහා වාලුකා නදී (මහවැලි නදිය), කදම්බ නදී(මල්වතු ඔය) ආදි ගංගා මිටියාවත්වල මෙරට ආර්ය ජනාවාස පිහිටුවන ලද බවත්, කැලණි ගං මුවදොර දේශීය ගෝත්‍රික ජන කොට්ඨාස වාසය කළ බවත් දැක් වේ (රත්නපාල, 1993). ඒ අනුව මූලික මිනිස් අවශ්‍යතා හා සබැඳි ගොවිතැන්, සත්ත්ව පාලනය, ප්‍රවාහනය, ආරක්ෂාව ආදිය මෙන්ම සමතුලිත පරිසර පද්ධතියට අවශ්‍ය පස, ජලය, ආලෝකය, උෂ්ණත්වය කෙරෙහි ද තම දැනුම ඉවහල්කර ගන්නට ඇත. තමාගේ දියුණුවට උපකාරිවන සුදුසු පරිසරයක ජීවත් වීම (පතිරූප දේස වාසය) බුද්ධ දේශණාවේ මංගල කරුණක් (මේධානන්ද, 1997: 825) වීම අතීත මානවයාගේ පරිසරානුබද්ධ අන්තර්ඥානය කෙබඳු දැයි මනාව ස්ඵුට වේ. එනයින් පරිසරය පිළිබඳ ශිෂ්ටාචාරගත මානවයාගේ ස්වාත්ම පරිඥනය හා ලෝක දෘෂ්ටිය යම් තෝරා ගත් පරිසරයක විසීම කෙසේදැයි මූලික පරිසර ක්ෂේත්‍ර තේමාවක් ලෙස හඳුනාගත හැකි වෙයි. මින් ගම්‍ය වනුයේ ස්වාත්ම පරිඥනය (තමන් තමන්ව හඳුනාගන්නා ආකාරය) සහ ලෝක දෘෂ්ටිය (බාහිර ලෝකය දෙස බලන ආකාරය) පිළිබඳ විග්‍රහය (මීගස්කුඹුර, 1995:95) මෙහි දී වැදගත් කොට සැලකිය යුතු බව ය. තවදුරටත් කරුණු විමසීමේ දී මානවයාගේ අවධානය ලෝකය පිළිබඳ ජෛව විද්‍යාත්මක පරිසර පද්ධති දක්වා යොමු විය. එහි දී මිනිස් වාසයට සුදුසු භෞතික පරිසරය සීමා වීමත් මිනිස් ජන සනත්වය ක්‍රමයෙන් ප්‍රසාරණය වීමත් ඊට හේතු විය. එතකුදු නොව යම් ප්‍රදේශයක සියලු ජීවීන් ද ඒ ජීවීන් සමඟ අන්තර්ක්‍රියා දක්වන එම ප්‍රදේශගත අජීවී පරිසරය ද ඇතුළත් ක්‍රියාකාරී ඒකකය ප්‍රාදේශී පරිසර පද්ධති යනුවෙන් හැඳින්වේ (විජයරත්න, 1995:12-13).

පරිසරය හා මිනිසා අතර පවත්නා අන්තර් සම්බන්ධතා විවිධ ආගම් අර්ථ දක්වති. ඒ අතුරින් බෞද්ධ මහා සතිපට්ඨාන සූත්‍රයේ අජ්ඣත්ත - බහිද්ධ යන යෙදුම් මගින් පරිසරය විස්තර කරයි. අජ්ඣත්ත යන්නෙන් යම් පුද්ගලයෙකු පරිසරය පිළිබඳ ගොඩනගා ගත් අභ්‍යන්තර මානසික තත්ත්වයක් ද, බහිද්ධ යනුවෙන් පුද්ගලයා අවට ලෝකයේ පවතින බාහිර පරිසරය ද, අර්ථවත් වේ (සාරානන්ද, 2016). එසේම ලක්දිව ආදිතමයෝ සැමවිටම ස්වභාවික පරිසරය හා බද්ධ වූ ජීවිතයක් ගත කිරීමට උත්සාහ ගත් අතර කිසි විටෙකත් පරිසරයෙන් වියුක්ත වූවෙකු ලෙස ක්‍රියා කිරීමට නො පෙළඹුණහ. මහින්දාගමනයේ දී මිහිඳු හිමි විසින් දේවානම්පියතිස්ස රජුගෙන් විමසන ලද වෘක්ෂ පිළිබඳ ප්‍රශ්ණාවලිය පරිසර දැනුම හා පරිසරය වෙත දක්වන ලද බන්ධුතාව පැහැදිලි ය. එහි දී සතුන් වෙනුවෙන් දක්වන ලද අභය දානය පරිසරකාමී විඥ්ඥාණයකින් යුතු බව අවබෝධ කර ගත හැකි ය. අප අවට පරිසරයට අවිච්ඡින්න සබඳතාවක් දක්වන විශ්වය හා එහි සම්භවය පිළිබඳ ආගමික මතවාද අතර මහා පිපිරුම් වාදය, ස්ථාවර තත්ත්ව වාදය, ස්ඵන්දමාන විශ්ව වාදය ආදිය පරිසර විෂයේම කොටස් වෙයි. මෙබඳු කරුණු මෙම පර්යේෂණයේ ඉලක්ක ගත අරමුණු කෙරෙහි ඍජුව අදාළ නොවූව ද පරිසරයේ සංකීර්ණත්වය අතීත මිනිසාට ද ඒ හා බැඳි සබඳතා ගොඩනැගීමට ඉවහල් වන්නට ඇති බැවිනි. මේ අතර පරිසරය විද්‍යාවක්, ශාස්ත්‍රයක් ලෙස ද, මිනිසා අතර පවත්නා අන්තර් සම්බන්ධය ආගම, කලාව, දර්ශනය විෂයානුබද්ධ පර්යත්තතාව ද, පැහැදිලි කර ගත හැකි වේ.

තවදුරටත් මෙම අධ්‍යයනයේ දී මිනිසාත් පරිසරයත් අතර සබඳතා විග්‍රහය කිරීමේ දී භෞතික හා සංස්කෘතික සබැඳියාව හඳුනාගත යුතු ය. එහි දී භෞතික පරිසරයේ භූ විෂමතා, ජලවහනය, පස, දේශගුණය, වෘක්ෂලතා ආදිය පාදක වූ කෘෂිකාර්මික, පශුපාලන, කාර්මික, නාවික, ප්‍රවාහන වැනි දෑ සංස්කෘතික පරිසරය බිහිවීමට මූලිකව ඇත. පරිසරයේ බලපෑම ජීවනෝපාය, සමාජ චාරිත්‍ර උදෙසා පමණක් නොව මිනිසාගේ ශරීර ලක්ෂණ හා බුද්ධි මට්ටම කෙරෙහි ද බෙහෙවින් බලපා

තිබේ (ප්‍රේමදාස, 2001: 6). ඉහත දැක් වූ සියලු විග්‍රහයන් පරිසරය හා මිනිසා අතර පවත්නා අන්තර් සම්බන්ධතා විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විමසන්නට හැකි අයුරු පසක් විය. එහි දී අප අධ්‍යයනයට උචිත තේමා කේන්ද්‍රීයව පරිසර සාරධර්ම මූලිකව ගොඩනැගීම සුවිශේෂ ලෙස සැලකී ය. ඒ අනුව පරිසර කේන්ද්‍රීය පද්ධති මානව කේන්ද්‍රීය, පුද්ගල කේන්ද්‍රීය ඉලක්කවලින් බැහැරව විශ්ව කේන්ද්‍රීය සාරධර්ම පද්ධතියක් අරමුණුව ගොඩනැගී ඇති බවට කරුණු දැක්වේ (ජයසේන, 2010: 10).

### 1.2 පරිසරය හා බැඳී ඇදහිලි විශ්වාස ප්‍රභවය හා විකාශය


ප්‍රාථමික මානවයා ස්වභාධර්මයේ වස්තූන් හා සිද්ධීන් අපූර්වත්වයක් සේ සලකා ඊට අධිමානුෂිකත්වයක් පවරා පූජනීයත්වයට පත් කොට ඇත. ඒ අතර ඊට උත්තරීතරත්වයක් ලබා දී අචේතනික වූ සොබාදහමට දේවත්වයක් ආරෝපණය කළ හ (ගමගේ, 1998). එය ආගමික සම්භවයේ මූලාරම්භයක් ද බව කියැවෙයි (එඩ්මන්ඩ්, 2004: 1). ඒ කෙරෙහි මිනිසා සොබාදහමේ වස්තූන් හා සිද්ධීන් පිළිබඳ පැවති අනවබෝධය ද මූලික වූ කරුණක් ලෙස පොදු පිළිගැනීමක්ව පවතී. එහෙත් තමාට අවබෝධකර ගැනීමට නොහැකි ස්වභාවික සිදුවීම් අර්ථවත් කරන්නේ එකී මිනිසුන්ගේ අනතර්ඥනය හා චිත්තවේග අනුව බව මෙහිලා සඳහන් කළ යුතු ය (අමරසේකර, 2000: 795).

පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාස ප්‍රභවය පිළිබඳ සොයා බැලීමේ දී එය කෙසේ, කවදා ඇතිවූයේ දැයි නිශ්චිතව සඳහන් කරීම අපහසු ය. එසේ වුව විශ්ව සම්භවය හා මානව පරිණාමය පසුබිම් වූ අතීතයට එහි ඓතිහාසිකත්වය විකාශය වන බව නොඅනුමාන ය. කාලානුරූපව විෂයානුබද්ධව මිනිසාගේ බුද්ධිය ක්‍රමිකව ගොඩනැගෙන්නක් බව පිළිගැනේ. ඉන් අදහස් කෙරෙනුයේ තම ජීවිතය පදනම් කර ගත් පරිසරය පිළිබඳ අත්දැකීම් සහිත දැනුම එකී කාලයට අනුව ප්‍රභවය වී ඇති බවකි (අමරසේකර, 2000: 790). එමගින් මිනිසා හා පරිසරය අතර පැවති අන්තර් සබඳතා පදනම්ව ලබා ගත් පරිසර දැනුම මත බිහි වූ සුවිශේෂ ජන වන්දනා විධි දෙකක් හඳුනාගන්නට විය.

ඉන් පළමු වැනි කාණ්ඩය ප්‍රාථමික මිනිසාට අවබෝධ කර ගත නොහැකි සොබාදහමේ සිද්ධියක් හෝ වස්තුවක් ඇත්නම් එය ශුද්ධ වූ දෙයක් ලෙස සලකුණු ලැබීමයි. ඉර, හඳ, තාරකා, අව්ව, වැස්ස, හෙණ හඬ, සුළඟ, නියඟය ආදියෙහි ක්‍රියාකාරිත්ත්වය අවබෝධ නොවුන ද මිනිසාගේ තියුණු වූ/ ගැඹුරු වූ හැඟීම් හා අවශ්‍යතා සම්බන්ධ වෙයි. එහි දී අතීත මානවයාට විශ්වයේ ක්‍රියාකාරිත්ත්වය අවබෝධ කරගැනීමට විද්‍යා ඥනය හෝ හේතුඵලවාදය පිළිබඳ අනවබෝධය සොබාදහමට දේවත්ව ප්‍රධානයට හේතු වූ බවට කරුණු දක්වති (දහනායක සහ පොන්නම්පෙරුම, 1970: 01). ඒ මත බිහි වූ අධ්‍යාත්මයට දේවත්වය ආරෝපණය කොට පූජනීයත්ත්වයට පත් කළ හ. එකී පරිසර වස්තූන් හා සිද්ධීන් මිනිසාගේ එදිනෙදා ජීවිතයෙන් දූරස්ථවූ ද, අවබෝධ කර ගැනීමට අපහසු සංකීර්ණ දේවල් වූ බව ද, පැහැදිලි ය. අතීත මිනිසා ගෝලාකාර වූ පෘථිවිය සමතලා හැඩයෙන් යුක්ත බව ප්‍රකාශ කරන්නට වූයේ එකල දැනුම් මට්ටම අනුව විය හැකි ය (එදිරිසිංහ, 2001: 78). එමෙන්ම මහාමේරු, චක්‍රාවාට, සප්ත සාගර, වඩබාමුඛ ආදිය පිළිබඳ දේවත්ව ආරෝපණය වුවත් භූගෝලීය හා සිද්ධි බැඳුමකින් ඇති විශ්වාසයෝ ය (දහනායක සහ පොන්නම්පෙරුම, 1970: 02).

දෙවන ගනයේ ලා සැලකෙන පරිසර වන්දන ප්‍රභවය විමසීමේ දී ප්‍රාථමික මානවයා තම ජීවිතයට අත්‍යවශ්‍ය ජලය, වෘක්ෂ, භූමිය වැනි දෑ පහසුවෙන් අවබෝධ කරගන්නට ඇත. එය තවදුරටත් තහවුරු කර ගැනීමට ඉහත විස්තර කෙරුණු ගංගා නිම්න ආශ්‍රිතව ශිෂ්ටාචාර පිහිටුවා ගැනීම මගින් තහවුරු කරගත හැකි ය. ඒ අනුව ප්‍රාථමික මිනිසා ඉන්ද්‍රීය සංජානනය හෝ අන්තර් ඥානයෙන් යුක්ත ව ජලය, වෘක්ෂ, භූමිය පිළිබඳ අවියෝජනීය සබඳතාව අවබෝධ කර ගන්නට ඇත. එකී පරිසර වස්තූන්ගේ පැවැත්ම උදෙසා ඊට දේවත්ත්වයක් ආරෝපණය කර ගත් බව හැඟේ. එම පරිසර සාධක නොකෙලසා සංරක්ෂණ අරමුණින් ඊට ආගමික පූජනීයත්ත්වයක් ප්‍රදානය අනවබෝධයෙන් නොකළ යුත්තක් බව කිව යුතු ය. ඒ අනුව ප්‍රාථමික පරිසරය වන්දනයේ

ප්‍රභවයට නව මතවාදයක් වන මෙය මානවයාගේ දැනුම, භාවිතය මෙන්ම විශ්වාස මත පදනම් වූ දෙ ආකාරයකට බිහිව ඇති බව නිරීක්ෂණය විය. එම බෙදීම පහත සටහන මඟින් වඩාත් පැහැදිලි කර ගත හැකි ය.




ප්‍රාථමික මානව ආගමික වත්පිළිවෙත් මෙයට පෙර වසර 50,000 ටත් 80,000 ටත් අතර කාලයක තිබූ බව සඳහන් වේ. ලෝකයේ පෙරදිග හා අපරදිග සියලු මානවයා හිරු හා අනෙකුත් ග්‍රහ තරු උදෙසා වත් පිළිවෙත් පැවැත්වූ හ. පෘථිවිය කෙරෙහි බලපවත්නා හිරු බැබිලෝනියාවේ ''ෂමාස්'' වශයෙන් ද, මිසරයේ ''රේ'' වශයෙන් ද, භාරතයේ ''රවි'' වශයෙන් ද, පුද පූජාවට ලක් වේ (කුලතිලක, 1996: 43). එකී මානවයාගේ පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාස පිළිබඳ සාධක ඓතිහාසික සොහොන් ගැබ්, ගුහා චිත්‍ර මඟින් ද අනාවරණ කර ගත හැකි ය. විශේෂයෙන් ප්‍රංශය, උතුරු ඇමෙරිකාව, ස්පාඤ්ඤය, ඉරානය, ඊශ්‍රායලය, දකුණු අප්‍රිකාව එහි දී වඩා වැදගත් වේ. අල්ටමීරා, ලැස්කොස් ආදි ගුහා චිත්‍ර පරිශීලනයේ දී සතුන්ගේ ඉරියව් හා දඩයම මූලික අභිචාර ක්‍රියාවන් ඊට පාදක වූ බව අවබෝධ කර ගත හැකි ය. එහි වෘක්ෂ ආදි වෙනත් පරිසර වස්තූන් දක්නට නොමැති වීමෙන් ඒවා දඩයම් යුගයට අයත් පරිසරානුබද්ධ විශ්වාස ලෙස හඳුනාගැනේ. අනතුරුව එළැඹුණු කෘෂිකාර්මික යුගයේ බිහි වූ වත්පිළිවෙත් මෙහි දී වැදගත් වනු ඇත. එම සංස්කෘතික සංක්‍රමණය දීර්ඝ කාලයක සිදු වූ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බවත් එකී ඇදහිලි විශ්වාස බිහි වීම ආර්ථික නිෂ්පාදන බලවේග මත රඳා පවත්නා බවත් අදහස් කෙරේ (ගම්ලත්, 1995: 52). මේ අනුව පරිසර වන්දනය තුළින් ඔවුන්ගේ ජීවන ක්‍රමය අනුව සමීප හේතුඵලාත්මක සබඳතාවක් විද්‍යමාන වෙයි.

බටහිර රතු ඉන්දියානු හෝපි ගෝත්‍රිකයෝ සොබාදහමේ අවස්ථා නිරූපණය කරමින් ගොඩනගා ගත් විශ්වාස මත සූර්ය, සුළඟ, වර්ෂා නැටුම් පවත්වන බවට තොරතුරු හමුවෙයි (native rain dance-wekipedia). ඒ අතර එකී හෝපි ගෝත්‍රිකයන් වගාවනට අධිපති දෙවියෙකුගේ මුහුණේ කම්මුල් මත ඇඳි රේඛා මඟින් වැහි වලාකුළු, විදුලි කෙටීම, වර්ෂාව නිරූපණය වන බව පරිසර වන්දනයේ ප්‍රභවය කෙරෙහි වැදගත් වනු ඇත (ගම්ලත්, 1995: 16).

එමෙන් ම පෙරදිග ඉන්දු ආර්ය සංස්කෘතියට පෙර මොහෙන්ජොදාරෝහි ක්‍රි.පූ. දෙවන ශතවර්ෂ ආසන්න යුගයට අයත් අං සහිත දෙවඟනක් ඇසටු ගසක් ආශ්‍රයෙහි සිටිනු දක්වන මේද වර්ණ පාෂාණ මුද්‍රාවක් සොයාගෙන තිබේ (රොලින්සන්, 1967: 15). ඒ හැරුණු කොට තත් යුගයට අයත් මහාතඩාංගය නාන පොකුණකි. එය යාග පැවැත්වීමට පෙර පවිත්‍රකරණය උදෙසා ජලය ස්නානය කිරීම සඳහා යැයි විශ්වාස කෙරේ (බෂාම්, 1962: 4). ඉපැරණි භාරතීය ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ

පරිසර බද්ධ ඇදහිලි විශ්වාස පිළිබඳ සොයා බැලීමේ දී ස්ත්‍රියකගේ යෝනියෙන් පැළෑටියක් නිකුත්වන ආකාරයක් දැක්වෙන මුද්‍රාවක් හමුවේ. ඒ අතර තවත් මුද්‍රාවක දෙපසට කවාකාරව පිහිටා ඇති අතුරිකිල්ලක් නැතහොත් ධාන්‍ය කරල් දෙකක් මැද වූ අං සහිත දෙවඟන හා ඇය වඳින්නෙකු දැක්වේ (මේධානන්ද හිමි, 1997: 188). මින් පැහැදිලි වනුයේ වෘක්ෂ වන්දනය දෙ ආකාරයකින් පැවති බවකි. මෙබඳු යම් වන්දනයක් පුද්ගලයකුගේ හෝ කිසියම් ගෝත්‍රයක ආරක්ෂාව, බලය සඳහා ගසක/ පැළෑටියක අභෞතික සංකේත ගෝත්‍ර චිහ්නවාදය අර්ථ ගන්වයි.

ලාංකේය ඉතිහාසයේ විවිධ තොරතුරු අනුව මෙරටට බොහෝ සමීපව ඇත්තේ ඉන්දීය සංස්කෘතිය යි. එය ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ම පැවති බවට තොරතුරු ඇත. මේ සබඳතා කෙරෙහි බොහෝ භාරත පරිසර වන්දනමාන, ඇදහිලි, විශ්වාසවලට මුල් වූ ආකෘතිකමය ලක්ෂණ මෙරටද ස්ථාපිතව තිබේ.

ලක්දිව ඓතිහාසික කැණීම්වලින් සොයාගන්නා ලද සාධක අනුව තන්තිරිමලේ ලෙන් සිතුවමක සූර්ය දේව ප්‍රතිමාවත්, අභයගිරි කැණීම්වල සූර්ය දේව යැයි විශ්වාස කරන ප්‍රතිමාවත් වැදගත් ය (පල්ලියගුරු, 2000: 544). එමෙන් ම අතීතයේ සිට සූර්ය වන්දන පැවති අතර රාවණ රජු සූර්ය භක්තිකයෙක් බවත් සමන්තකූට පර්වතයේ ද සූර්ය දේවාලයක් පැවති බවත් සඳහන් වෙයි. සමන්ගිර මූලිකව හිරු පිදීමේ චාරිත්‍ර වර්තමානයේද දැකිය හැකි වීම එය තවදුරටත් සනාථ කරන්නකි. පොළොන්නරුවේ එගොඩ පත්තුවේ පුල්ලිගොඩ ස්ථානයේ ගල් ලෙනක දෙව්වරුන් කිහිප දෙනෙකුගේ චිත්‍ර විමසුමේ දී එම ස්ථානයේ වැසි ලබාගැනීමට පුද පූජා පවත්වා ඇති බවත් එය පර්ජන්‍යට කරන ලද වත්පිළිවෙත් බව අනුමාන කෙරේ (විමලවංස හිමි, 1961: 88). එපමණක් නොව ලාංකේය ඉතිහාසය පිළිබඳ තොරතුරු අන්තර්ගත මහාවංශයට අනුව පණ්ඩුකාභය රාජ්‍ය සමයේ වෙස්සවණ දෙවියනට නුග ගසක් ද, ව්‍යාධ දේව සඳහා තල් ගසක් ද, වෙන් කළ බව සඳහන් වේ (ශ්‍රී සුමංගල හිමි, 1994: ගාථාව 89). මෙය ලාංකේය වෘක්ෂ වන්දනාව පැවති බවට වැදගත් ඓතිහාසික ශාක්ෂියක් වනු ඇත. එමෙන් ම ලක්දිව ගෝත්‍රික වැදි ජනතාව අතර පවත්නා කිරි කොරහ ශාන්තිකර්මය විශේෂ උත්සවයක් ලෙස සැලකිය යුතු ය. කොරහේ ලූ කිරි ගහ කොළවලට හා වගාවලට ඉසීමෙන් ඒවා මැනවින් පල දරන බවත් රෝගවලින් ආරක්ෂා වන බවත් වැද්දෝ පවසති (රත්නපාල , 2003: 119). මෙවැනි පරිසර ඇදහිලි විශ්වාස අතීතයේ සිටම පැවත ඇති බව මහාචාර්ය රාජ් සෝමදේව විසින් ගල්පායේ දී සිදු කරන ලද කැණීම් මඟින් තවදුරටත් අනාවරණය කරයි. එහි දී හමු වූ යාතුකර්මවල දී පැන් වත්කිරීමට යොදාගත් කෙණ්ඩි වැනි භාජන මෙහි දී වැදගත් වනු ඇත (සෝමසුන්දර, 2010: 27).

පරිසර වන්දනය කෙරෙහි බෞද්ධ ආගමික සබඳතාව ගැඹුරින් විමසිය හැකි ක්ෂේත්‍රයකි. එසේ නමුත් සංක්ෂිප්තව හෝ අදහස් දැක්වීම අපගේ අරමුණු කෙරෙහි උපයෝගිවනු ඇත. බුදු තෙමඟුල සිදු වූයේ ලුම්බිනි සල් උයන, ඇසතු රුක මුල, කුසනාරා උපවත්තන සල් උයන ආදි ස්වභාවධර්මය ආශ්‍රයෙනි. එමෙන් ම වස් විසීම පිළිබඳ ශික්ෂා පනවන ලද්දේ තෘණ ආදි කුඩා ශාක ද රැකගැනීමේ අපේක්ෂාව ඇතිව ය (සද්ධාරතන හිමි, 2011: 47) ඒ අතර විශ්වය, පරිසරය පිළිබඳ අග්ගඤ්ඤ, කූටදන්ත, අම්බට්ඨ, කෙවඩ්ඩ, තෙවිජ්ජ, වාසෙට්ඨ, වැනි සූත්‍ර දේශනා වැදගත් ය. ඒ හැරුණු කොට මහා සමය, ආටානාටිය සූත්‍ර ස්වභාවික වස්තූන්ට හා සංසිද්ධීන්ට සෘජුව හෝ සහසම්බන්ධතා මත යක්ෂ දේව ආරෝපණයක් දැක්වේ. එහි දි හිමවන්ත පර්වතය, සාතාගිරි පර්වතය, වෙස්ස මිත්ත පර්වතය, වේපුල්ල පර්වතය ආශ්‍රිත ව පිළිවෙලින් හේමවත, සාතාගිර, වෙස්සමිත්ත හා කුම්භීර යක්ෂ සේනාවන් උපන් බව සඳහන් වේ. එහිම ධෘතරාෂටයන්ගේ ගන්ධබ්බ දෙවියෝ වෘක්ෂයන් හි මූල (මුල්), සාර (අරටුව), ඵෙග්ග (එළය), තච (පොතු), පපටිකා (පතුරු), පත්ත (කොළ), පුප්ඵ (මල්), ඵල (ගෙඩි), රස (යුෂ), යනාදියෙ හි අධිගෘහිතව වෙසෙතියි සඳහන්වේ (අරියධම්ම හිමි, 2018: 146). එමෙන් ම ජාතක පොත, ධම්ම පදය, ථෙර ථේරි ගාථා ආදි බෞද්ධ සාහිත්‍යයේ පරිසර මූලාශ්‍රය සුවිශේෂ වනබව සඳහන් කළ යුතු ය. අද්‍යතනයේ ලාංකේය බෞද්ධ සමාජය පවත්වන බෝධි පූජා, පිරිත් පිංකම, නානුමුරය, දියකැපීම ආදි පුද පූජා හා වත්පිළිවෙත් අතීත මිනිසාගේ පරිසර බද්ධ ජීවිතය විශද කරයි.

මෙම තොරතුරු මත පදනම්ව අතීතයේ සිට මෙරට සොබාදහමේ වස්තූන් කෙරෙහි සෘජුව හෝ වක්‍රාකාරව පුද පූජා, වත්පිළිවෙත් පවත්වා ඇති බව නිරීක්ෂණය කෙරේ. උක්ත කරුණු සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ ප්‍රදේශික පරිසර සාධක මූලිකව ඇදහිලි විශ්වාස ප්‍රභවයව ඇති බවයි. මෙතෙක් අප අධ්‍යයනයට ලක් කෙරුණු පරිසරයත් මිනිසාත් අතර පවත්නා අන්තර් සම්බන්ධතාව හා පරිසර වන්දනයේ ප්‍රභවය හා විකාශය අධ්‍යයනයේ විමසීමට ලක් කෙරෙන පහතරට ශාන්තිකමවල පරිසරානුබද්ධතා අධ්‍යයනයට සෘජු සබඳතාවක් පවත්නා බව අවධාරණය කළ යුතු ය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ ඉලක්කගත ගැටලුව හා අරමුණු සලකා බැලීමේ දී ඇදහිලි විශ්වාස හා බද්ධ පරිසර විෂය ක්ෂේත්‍රය සමාජ සම්බන්ධ චර්යාත්මක අධ්‍යයනයක් ලෙස හඳුනාගත හැකි ය. ඒ කෙරෙහි පරිසරානුබද්ධ සමාජ සම්බන්ධතා, සංස්කෘතික විසරණය, ආගමික මතවාද මූලික වූ භෞතික මානව හා සංස්කෘතික මානව සබඳතා විශ්ලේෂණයට මානව වංශ විධික්‍රමය වැදගත් විය. එමෙන් ම පරිසරානුබද්ධ සංස්කෘතික රීතීන් හී අන්තර්ගත දර්ශනය මිනිසාගේ අවශ්‍යතා මෙන්ම පරිසර පැවැත්ම ද මූලික වූ සමෝදානීය ගුණයෙන් යුතු සංසිද්ධි පිළිබඳ විමසුමට ලක් වූවක් බව දැක්විය යුතු ය. උක්ත අදහස් අනුව පරිසර සංස්කෘතික රීති කෙරෙහි බලපවත්වන ප්‍රධාන සාධකයක් වනුයේ මානව ආකල්ප බව නිරීක්ෂණය විය. ඒ අනුව පුද්ගලයෙකු යම් පරිසර වස්තුවක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් ගොඩනඟාගත් දැනුම හා අත්දැකීම් එකී ආකල්ප කෙරෙහි බලපවත්වයි. එහෙත් එකී ආකල්ප මිනුම් කිරීමට සංඛ්‍යාත්මක දර්ශකයක් භාවිතය ගුණාත්මක නොවනුයේ පුද්ගල සංකීර්ණ මානසික ප්‍රපංච මත බලපවත්වන බැවිනි. එකී මානසික ප්‍රපංච පහතරට ශාන්තිකර්මවල පරිසරානුබද්ධ දැනුම, අත්දැකීම්, ආකල්ප විමසුම ඥාන මීමංසාත්මක අරමුණු ගතව තිබීම මෙය ගුණාත්මක පර්යේෂණයක් ලෙස සැලකේ.

ඒ අනුව මෙම විමසුම පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් දත්ත රැස් කිරීම සිදු විය. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූ පහතරට ශාන්තිකර්මවල ජලය, වෘක්ෂ හා භූමිය මාතෘකාගත කෘති විරල හෙයින් ශාන්තිකර්ම නිරීක්ෂණය දත්ත සපයා ගැනීමට ඉමහත් පිටිවහල් වූ බව සඳහන් කළ යුතු ය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් විෂය සීමා වූ පහතරට ශාන්තිකර්ම දහයක් 2025 වර්ෂයේ පළමු කාර්තුව අතර නිරීක්ෂණයට සහ සහභාගීත්ව නිරීක්ෂණයට ලක්විය. බස්නාහිර සහ දකුණු පළාත්හි ප්‍රචලිත මඩු ශාන්තිකර්ම, සන්නියකුම, සූනියම් සහ බලි ශාන්තිකර්මය භූගෝලීය සහ ශාන්තිකර්ම නියැදිය ලෙස සැලකීය. එමෙන් ම පරිසරානුබද්ධ සමාජ ආකල්ප විමසීමේ දී විෂය ප්‍රාමාණික දැනුමැති සහ සාමාන්‍ය පොදු ජනයා සමඟ නිශ්චිත ප්‍රශ්නාවලියකින් තොර අර්ධ ආකෘතික සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයට ගැනුණි. ඒ අනුව ගුණාත්මක දත්ත පරිශීලනයේ දී සවිස්තරාත්මක විමසුම කෙරෙහි දැඩි අවධානයක් යොමු විය. එමඟින් දත්ත විශ්ලේෂණය හා ප්‍රතිඵල වාර්තා කිරීම වඩාත් ක්‍රමානුකූල ලෙස ඉදිරිපත් කිරීමට හැකියාව ලැබුණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### පහතරට ශාන්තිකර්මවල පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාස

ලක්දිව ගැමි ආගම විමසුමේ දී ස්පර්ශිත ප්‍රධාන ධාරාවක් වශයෙන් ශාන්තිකර්ම හඳුනාගත හැකි ය. එය ගැමි ජීවන පැවැත්ම සඳහා උපයෝගීවන සංකීර්ණ ක්‍රියාවලි රැසක් මඟින් ජීවත් වීමේ පරමාර්ථය සපලකර ගැනීමට දායක වන්නක් වශයෙන් ද ගොඩනැඟුනකි. ඒ අතර එකී පද්ධතීන් අදාළ ප්‍රදේශයේ භෞතික පරිසර සාධක මත ක්‍රියාත්මක වන්නක් බවද සඳහන් කළ යුතු ය. එමෙන් ම මෙරට ප්‍රාථමික හා ප්‍රාග් බෞද්ධ යුගය දක්වා පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාස පැවති බවට සාධනීය තොරතුරු වැදගත් ය. පසුකාලීනව ඇති වූ ආගමික, දේශපාලන, ආර්ථික තත්ත්වය මත ඇති වූ සංස්කෘතික විපර්යාස ඇදහිලි විශ්වාස කෙරෙහි ද බලපාන්නට ඇත. ඒ අතුරින් බෞද්ධාගමික හා භාරතීය ආගමික මතවාද බලවත් වන්නට ඇති බව සහේතුකව දත්ත ඉදිරිපත් කළ හැකි ය. වත්මනෙහි මිනිසාගේ ලෞකික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ලක්දිව ප්‍රචලිත බෝධිපූජා, පිරිත් පිංකම, නානුමුරය ආදී පරිසරය හා බැඳි සමාජ ආගමික ක්‍රියාවලීන් ඒ බව සනාථ කරයි. මිනිසාගේ බුද්ධි වර්ධනයත් සමඟ ජීවත්වීමේ අපේක්ෂා, යහපත් ජීවන ක්‍රමයක් උදෙසා චිකිත්සන කෙරෙහි යොමු වන්නට ඇත. දේශීය වෛද්‍ය, ආයුර්වේද ශාස්ත්‍ර මෙන් ම ශාන්තිකර්ම එහිලා වැදගත්වන අතර ඒවා පරිසර සාධක මත ගොඩනැඟී තිබීම විශේෂ ය. මේ හා සමගාමීව ගොඩනැඟුණු සොබාදහම හා බැඳී පැවති සංස්කෘතිය ආගම, කලාව, ඉතිහාසය, විෂය පද්ධති ශාන්තිකර්ම වත්පිළිවෙත් මඟින් පිළිබිඹු කෙරේ.

සොබා පරිසර වස්තූන් වෙත වන්දනීයත්වය ආරෝපණය කිරීම ශාන්තිකර්ම සාහිත්‍යයෙන් ප්‍රකට වන අතර බොහොමයක් වත්පිළිවෙත් පරිසරානුගතව ගොඩනැගී තිබීම පොදු ධර්මතාවකි. මෙවැනි ස්වභාවික වස්තූන් අතර වෘක්ෂලතා, ජලය, භූමිය ආදිය විශේෂ වේ. එවැනි දෑ ජන ඇදහිලිවලට අන්තර්ග්‍රහණය වීමට බලපෑ සමාජ, සංස්කෘතික, ආගමික හා මනෝවිද්‍යාත්මක සාධක රැසක් පවතී. ශාන්තිකර්ම සාහිත්‍ය පරිශීලනයේ දී දෙවියන්, යකුන්, ග්‍රහයින් ආදීන්ගේ වාසස්ථාන, වාසභවන, අරක්ගැනීම්, සැරිසැරීම් වෘක්ෂ මෙන් ම ජලාශ, කඳු, පර්වත ආශ්‍රයව තිබීම මෙම අධ්‍යයනයේ දී වැදගත් විය. ශාන්තිකර්මවල විවිධ උපත් කතා, පුරා කතා මඟින් ඒ බව පැහැදිලි කරයි. රුක් පේකිරීම, මල පේකිරීම, මිල්ල කැපීම, රුක් පූජා, මල් පූජා, අත්ත මැතිරීම, නවකොළ අත්ත මැතිරීම, ඇස්වහ මැතිරීම, කප් සිටුවීම වැනි වෘක්‍ෂලතා සම්බන්ධ පූජා මෙන් ම, ජලය හා බැඳුණු නානුමුර මංගල්‍යය, දිය කැපීම, තොට පේ කිරීම, දිය කෙළි සමයම, කහදියර කන්නලව්ව ආදි වත්පිළිවෙත් ද, භූමිය හා බැඳුණු භෛරව පූජා, මැටි පේ කිරීම ආදියෙන් ද පැහැදිලි වනුයේ පරිසර වස්තූන් හා බැඳි සුවිශේෂ අරමුණු මුල්කොට ඇති බව යි. එමෙන් ම ශාන්තිකර්මයට අදාළ පරිසරයක් සැකසීම එහි ඇති මූලික ක්‍රියාවලියක් වෙයි. සොබාදහමේ වස්තු උපයෝගයෙන් පූජා භාණ්ඩ, රඟමඬල සැරසිලි, ඇඳුම් පැළඳුම්, රංගභාණ්ඩ සැකසීමට ඒ ඒ ශාන්තිකර්මයට නියම වූ පිළිවෙත් ශාන්තිකර්ම සාහිත්‍යයෙන් බිහිව ඇත. මෙහි දී උක්ත අවස්ථා කිහිපයක් පිළිබඳ විමසීම වැදගත් වේ.

**ශාන්තිකර්ම උපත් කතා හා පරිසරය**

ශාන්තිකර්ම ප්‍රභවය කෙරෙහි බලපෑ ආගමික, සමාජ තත්ත්ව මෙන් ම ඒ හා බැඳි පරිසර සබඳතා අනුව සූනියමේ ප්‍රචලිත උපත් කථාව මැණික්පාල බිසවට වූ රෝගය වාතය අපිරිසිදු වීම හේතුකොට වූවක් බව නිරීක්‍ෂණය විය. විෂ ශරීරගතවන ස්වභාවය අනුව දෂ්ඨ විස, දිට්ඨ විස, ඵුට්ඨ විස හා වාත විස යනුවෙන් දැක්වේ (අරියධම්ම හිමි, 2018: 152). එපමණක් නොව වාත විස අහිරාජ කුලයට අයත් සර්ප විස මුසු වාතය බව එහි විස්තර කෙරේ.

ඒ අනුව මැණික්පාල බිසවට වූ විනය පොළඟකුගේ සබඳතාව මත අභිවාතක නම් වූ රෝග ලෙස ශාන්තිකර්ම සාහිත්‍යයේ දැක්වේ. මේ අනුව වාතය රෝග කාරක/ වාහක වශයෙන් ක්‍රියා කිරීමට හේතුවන බවත්, එය ශාන්තිකර්ම සාහිත්‍යයේ දර්ශනය වීමත් මෙහි දි වැදගත්වනු ඇත. ඇතැම් ශාන්තිකර්ම සඳහා පෙළපාලි, පූජා භාණ්ඩ, පිළිබඳ උපත් කතා එකක් හෝ කිහිපයක් තිබිය හැකි ය. සන්නි යකුම ශාන්තිකර්මයේ එක් උපත් කතාවකට අනුව අසූපාල කුමරිය නිවරැද්දේ වරදට මැරූයේ කැබෙල්ල රුකක එල්ලා ය.

රොසින් නිරිඳු ගිනි සේ සුවිපුල්ලා
ඇසින් පෙනෙන්නට නොහැර මෙකෙල්ලා
ගොසින් සොහොන්පල ගසේ කැබැල්ලා
ලසින් කපවී ගස පළුවක් එල්ලා

ඒ අතර ශාන්තිකර්මවල පුද ලබන දේව, යක්ෂ කොට්ඨාස වෘක්ෂ, ජලාශ්‍රිත හා පර්වත ආදී ස්ථාන හා සම්බන්ධ නාමකරණ කිහිපයක් පහත දැක්වේ. මල් කඩවර, රුක්මල් කඩවර, නාමල් කඩවර, සපුමල් කඩවර, පුෂ්පගිරි, මළඉර බහින කොට දීපන් රීරි ගොටු, මදන යක්ෂණී ඉසිගිලිවනේ නුග සෙවනේ වාසය, මුහුදු හත, වැව් හත, පොකුණු හත, සක්වල ගල, අඳුන්ගිරි පර්වතය, දඹරුක මුදුනේ වාස කරන යකු, ගං තොට, වැව් තොට ආදී බොහෝ අවස්ථා දැක්විය හැකි ය.

ඉන්නේ උතරු කුරු දිවයින නුග මුලෙකා
පැන්නේ විසල් නුවරට පෙර වෛරයෙකා
ගන්නේ ලීය තැන තැන මිනි මස් ම කකා
එන්නේ පුදට තෙද දළ මරු සන්නි යකා

**කප් සිටුවීම/ මිල්ල කැපීම**

දෙවියන් උදෙසා පැවැත්වෙන ගම්මඩු, දෙවොල් මඩු, පූණා මඩු, කෝල්මුර යාගය, කප් ඉන්දුම් මඩු, හත්දා ගී මඩු, තුන්දා ගී මඩු ආදී ශාන්තිකර්මවල දෙවියන් කෙරෙහි භාර වීමක්/ පොරොන්දු වීමක්/ ගිවිස ගැනීමක් වශයෙන් කප් සිටුවීම සිදු කරයි. ඒ සඳහා භාවිත කප් කණුව ඉඹුල්, රුක්අත්තන, සූරිය, මුරුංගා, කොස් ආදිය ප්‍රාදේශීය විවිධතා අනුව යොදා ගැනේ. කප් සිටුවීමට සුබ දිනයක් තීරණයෙන් පසු එම ගස වටා ශුද්ධ පවිත්‍ර කොට පහනක් දල්වා, දුම් අල්ලා, කහදියර ඉස නියමිත දිනට වෘක්ෂය කැපීමට එම ගසට අධිපතිව සිටිනා බලවේගයකින් අවසර ඉල්ලයි. මෙහි දී වඩාත් අවධාරණය කළයුත්තේ එම ගසෙන් අත්තක් පමණක් කැපීම ය. ඒ අනුව ගස් සහමුලින් විනාශ වීමක් නොවන අතර එකී වත්පිළිවෙත් පරිසරයට සංවේදී මානසිකත්ත්වය ගොඩනැඟීමට ඉවහල් වන බව ය. ශාන්තිකර්ම සාහිත්‍යයට අනුව මඟුල් කපට ගැයෙන කවියක් පහත් දැක්වේ.

උතුරු දිගින් ගස දැක සතොසින්නේ
ඇදුරු ගොසින් ගස එළිකර ගන්නේ
සුවඳ සඳුන් මල් බුලත් පුදන්නේ
ඇදුරුද මේලෙස දැන පවසන්නේ

එමෙන් ම මිල්ල කැපීමද ඉහත ශාන්තිකර්මවල දෙවොල් දෙවියන් උදෙසා ගිණි පෑගීමට යොදා ගන්නා මිල්ල දර සපයා ගැනීමේ දී සිදු කෙරෙන වත්පිළිවෙතකි. එහි දී ගසෙන් අත්තක් පමණක් කැපීම විශේෂ ය. උක්ත වත්පිළිවෙත් දෙකෙහි ම චාරිත්‍රවල ප්‍රාදේශීය විශේෂතා තිබුණ ද පොදු සමානතාවක් නිරූපණය වේ. ප්‍රධාන කපු මහතා, අනෙකුත් ඇදුරු පාර්ශ්ව සහ කොට්ටේරුවා/ වට්ටාඩියා/ අතෝරකරුවා/ ආවතේවකරු නා පිරිසිදුවී මල්, පහන්, සුවඳ දුම්, බුලත්, කහදියර, පඬුරු, පැහිඳුම් කඳ (කෙසෙල්, පොල්, සහල්) ආදී පූජා ද්‍රව්‍ය සමගින් කැත්තක්/ පොරොවක් රැගෙන ශබ්ද පූජා පවත්වමින් පෙරහරින් යයි. එකී ගසට පූජා පිළිවෙත් පවත්වා මඟුල් බෙර වාදනය හා නියමිත ශාස්ත්‍රීය පූජා නර්තන කිරීමක් ද සිදු කෙරේ. එමෙන් ම අදාළ කවි, කන්නලව් ගායනා කිරීමෙන් පසු කැත්තෙන් අත්තක් කපා පිරුවටයක ඔතා පෙරහරින් රැගෙනයාම සිරිතයි. මෙවැනි චාරිත්‍ර මිනිසා පරිසරය කෙරෙහි දැක් වූ සවිඥ්ඤාණකත්වය ප්‍රකාශ කරන ලද ක්‍රමයකි.

කැලේ ගොසින් අමු මිල්ල කපන්නේ
මැලේ සදා වට වියන් බඳින්නේ
තෙලේ පෙළොන් රැළ සේ ඇවිලෙන්නේ
බලේ මහිම වද මහ සාමින්නේ

**රුක් පේකිරීම, මල පේකිරීම, රුක් පූජා, මල් පූජා**

ශාන්තිකර්මයට අවශ්‍ය පොල් මල්, පොල්, ගොක් අතු, පුවක් මල්, පුවක් අතු, දළුමුර ආදිය සපයා ගැනීමට එකී ගහ කොළ රුක් පේකිරීම, ගස් වෙන් කිරීම, ගොප් බැඳීම යනුවෙන් චාරිත්‍රයක් සිදු කරයි. එම වෙන් කරන ලද ගස වටා ගොක් රැහැන් ඇඳීම හෝ ගස වටා ගොක් කොළයකින් ගැට ගසනු ලබයි. එසේ සිදු කරන ලද ගහ කොළ දෙවියන් වෙනුවෙන් කැප කරන ලද බවත්, ඒවා භුක්ති විඳීමෙන් වැළකී සිටීමටත් ජනයා වගබලා ගනී. ශාන්තිකර්ම පැවැත්වීමේ දී අත්‍යාවශ්‍ය වෘක්ෂයක් ලෙස පොල් ගසට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. ශ්‍රී ලාංකිකයන් මෙලොව කප්රුක ලෙෂ ද, බ්‍රාහ්මී සාහිත්‍ය නාඩිර වශයෙන් ද, සංස්කෘත භාෂාව නාඩිකේර ලෙෂ ද, හඳුන්වන්නේ පොල් ම ය. එමෙන් ම තවදුරටත් ශාන්තිකර්ම සාහිත්‍ය පරිශීලනයේ දී නැළි, නෙළි, නෙරළු ලෙස ද දැක්වේ. පොල් හා මෙරට ඓතිහාසික සබතාඳ පිළිබඳ බොහෝ තොරතුරු අතුරින් මෙහිලා ඒ හා බැඳි ආගමික පසුබිම වැදගත් කොට සැලකේ. පොල් හා බැඳි ශාන්තිකර්ම උපත් කතාවල ඊශ්වර, ගණේෂ ආදී ඉපැරණි හින්දු දේව සංකල්ප සම්බන්ධකර ඇත. ඒ හා බැඳි උපත් කථාවක

මැණික්පාල ශාන්තිකර්මයට පොල් රැගෙන ඇත්තේ නන්ද ඍෂිවරයා විසින් සත් මුහුදට එපිට එදේසෙක සිට බව සඳහන් වේ. එමෙන් ම ගණදෙවියන්ගේ උත්පත්තිය හා ගොඩනැගුනක් බවද ශාන්තිකර්ම සාහිත්‍යයේ අන්තර්ගත ය.

තුන්නෙත් ගනදෙවි කිරුළිස    දරනා
දුන්නෙත් මේ පොල් ගන දෙවි    විසිනා
පන්තිස් යාගය ඇදුරෝ    කරනා
පොල් ගෙඩියට සැම දෝෂය    බසිනා

පොල් ගසේ පල හා වෙනත් කොටස් අතර පොල් අත්ත, ගොප් අත්ත, පොල් ගෙඩිය, පොල් මල්, ඉරටු, තැඹිලි, කුරුම්බා, හනසු, මටුළු, අතු, පිති, කොළ, මුල් ආදිය ශාන්තිකර්ම සදහා යොදා ගැනේ. ඒ අතුරින් ගොප් අත්ත, ගොක් අත්ත, ගොබ් අත්ත යනුවෙන් ද, පුලුප්, පුලුක්, වශයෙන් ද හඳුන්වන්නේ ශාන්තිකර්ම සැරසිලි සදහා අත්‍යාවශ්‍ය ගොක් අත්ත ය. පුෂ්ප කර්ම හෙවත් මල් පූජාවේ ඓතිහාසිකත්ව විමසුමේ දී එය ආර්ය සංස්කෘතියෙහි පැවති පශු කර්මය හෙවත් සත්ත්ව පූජාව වෙනුවට ද්‍රවිඩ සංස්කෘතියෙන් ආභාසය ලැබූවක් බවට කරුණු දැක්වේ. එමෙන් ම බුදු දහමේ බලපෑම හේතුවන්නට ඇති බවට අදහස් කෙරේ (මාරසිංහ, 2013, 41). කිළිඟු කුලය රජ ආදී උතුමන්ට මල් සපයන කුලයකි. දිවා කාලයේ උත්සව අලංකරණයට සූර්යා ලෝකයෙන් විකසිතවන මල් වර්ග ද, රාත්‍රි කාලයේ උත්සව සඳහා සඳ එළියට විකසිතවන මල් වර්ග ද, යොදා ගෙන ඇත (සඳුනිකා, 2017, 134). ශාන්තිකර්ම නිරීක්ෂණයේ දී මල් පූජා කිරීමට පමණක් නොව රඟමඬල සැරසිලි, රංග ආභරණ මෙන් ම රංග භාණ්ඩ වශයෙන්ද යොදා ගනී. සූනියම් වීදිය සැරසිමට යොදා ගන්නා මල් පිළිබඳ කාව්‍යා වලියක මෙසේ දැක්වේ.

පිච්ච පෙතන් සපු නා මල් පෙළින්    පෙළේ
සුද්ද සමන් කිනිහිර සුදු නෙළුම්    මලේ
සුද්ද නිමල් මානිල් මල් පෙළින්    පෙළේ
සුද්ද මෙලෙස සිත්තර කර උඩු    මාලේ

**තොටපේ කිරීම, කහදියර කන්නලව්ව, නානුමුරය**

මිනිසාගේ උපත, වැඩිවිය, විවාහය හා මරණය වැනි ද්වාරකර්ම අවස්ථාවල දී සෑම ආගමක ම ජලය ශුද්ධ වස්තුවක් ලෙස භාවිත කිරීම පිළිගත් ධර්මතාවකි. එමෙන් ම බෞද්ධ දේශණාවේ සිවු මහා භූත සංකල්පයේ ආපෝ යනුවෙන් ද හැඳින්වෙන්නේ ජලයයි. පර්යේෂණ මාතෘකාව අනුව විෂය සීමා වූ සෑම ශාන්තිකර්මයක ම ජලය වන්දනය එකී සාහිත්‍යයෙන් ප්‍රකටවන අතර උපත් කතා හා පුරා කතා අධ්‍යයනයෙන් ඒ බව තහවුරු විය. මෙහි දි ජලය පවිත්‍ර කාරකයක් වශයෙන් යාගපල, ඇදුරු හා ආතුර  පිරිසිදු කිරීමට යොදා ගැනේ. ජලය පිළිබඳ ප්‍රකට උපත් කතාවකට අනුව සුමණ සාමනේර හිමි අනවතප්ත විලෙන් පැන් ගෙන ඒම හා සතරවරම් දෙවිවරුන් රන් කොතලයක් මවා සක් දෙව් අනවතප්ත විලෙන් පැන් ගෙන් ඒම වෙනත් කථාවක ද සඳහන් වෙයි. මේ අතර මහාබ්‍රහ්මයා වැඩ සිටින්නේ නෙළුමක් මත වීමත් ජලජ යනු නෙළුම වන ජලජාසනය යි. එනම් බ්‍රහ්මන් වෙයි (පැට්රික්, 2000: 52). එමෙන් ම   මහා බ්‍රහ්මයා මුහුණු පසකින් යුතු බවත් ඒවා පොළව, ජලය, ගින්න, වායුව, හා අහස ලෙස අර්ථ දක්වා තිබීම සුවිශේෂ වනු ඇත (අයඝීවංශ, 1958: 19). ඒ ඒ අවස්ථානුකූලව ජලය පරිහරණ විධි ළිං, ගංගා, විල්, පොකුණු, වැසි, සාගර, උල්පත්, දියඇළි, වශයෙන් යාග සාහිත්‍යයේ දැක්වේ. ඒ අතර වැසි දිය ශීතල ය, පිරිසුදු ය, මංගලකාරකය හා ශුද්ධය ආදි සතර ගුණයෙන් යුක්ත බවත් පොළවට පතිත වීමෙන් අදාළ භූමියේ ස්වභාවය අනුව වෙනස් වේ (බුද්ධදාස, 1960: 183). සූනියම ශාන්තිකර්මයෙහි ප්‍රධාන අංගයක් වන නානුමුරය ජලය හෝ ජලය මිශ්‍රිත ඖෂධ ස්නානය, හිස ගැල්වීම, පානයක් ලෙස යොදාගැනේ. මේ අනුව එකී වත්පිළිවෙත් ජල චිකිත්සනයක් වශයෙන් යොදාගෙන ඇති ආකාරය නිරීක්ෂණය කෙරේ. බොහෝ ආගමික වත්පිළිවෙත් සිදුකිරීමට ප්‍රථමයෙන් චෛතසික ශුද්ධියට පළමුව බාහිර ශරීරය පිරිසිදු කරගත යුතු බව සැලකිය යුතු ය. ශරීරයේ බහිශ්‍රාව ද්‍රව්‍ය

නවද්වාරයකින් පිටවන බවත් එය පිරිසිදු කිරීමට ස්නානය වැදගත් වන අතර විඩාව පහ නොවූ කල්හි ද, පළමුව මුහුණ නොසෝදා ද, නිර්වස්ත්‍රයෙන් තොරව ද, ස්නානයෙන් පසු ඇඳි වතින් හිස නොපිසින්නේය ද, යන්න ආයුර්වේදයේ සඳහන්ය (බුද්ධදාස,1960:150). ශාන්තිකර්ම සාහිත්‍යයේ කහදියර උපත පිළිබඳ කාව්‍යාවලියේ මෙසේ දැක්වේ.

තෙරිඳුන් එතනින් පැන් පුරවා ගෙන
එර්දි වෙලා එන හංස රජක මෙන
නා රජ මතුවෙයි වෙයිර සිතා ගෙන
එතකොට තෙරිඳුන් ගුවනේ සක්මන

ශාන්තිකර්ම පැවැත්වීමේ දී එකී ශාන්තිකර්මයට අදාළ පූර්ව චාරිත්‍ර සිට අවසානයේ ඇඳුරන්ට බුලත් අතක් මත පුද පඬුරු ලබා ගැනීම දක්වා සිදුකරන චාරිත්‍ර වාරිත්‍ර බොහෝ ය. ශාන්තිකර්ම පැවැත්වීමේ මුඛ්‍ය පරමාර්ථය රෝගාතුරයා සුවපත් කිරීම හෝ ප්‍රදේශයට සශ්‍රීකත්ත්වය ළඟාකර ගැනීම විය හැකි ය. එසේ වුව සොබාදහමේ වස්තූන් මූලික ව සිදුකරනු ලබන ඇදහිලි විශ්වාස පුද පූජා මඟින් ජන ජීවිතයේ යහපත පමණක් නොව සොබාදහමේ ආරක්ෂාව හා පැවැත්ම කෙරෙහි ද බලපානු ඇති බව මෙතෙක් අවධානයට ලක් නොවූවකි. උක්ත සංක්ෂිප්ත තොරතුරු පරිසර විෂයෙහි මානව චර්යා ගොඩනැඟීමට සංවිධාන වූවක් ලෙස හඳුනාගත හැකි ය. මිනිසා පරිසරය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත වූවකු බවත් උපක්‍රමශීලීව වත්පිළිවෙත් සිරිත් චාරිත්‍ර භාවිතයෙන් පරිසර පැවැත්මට උපයෝග කොට ඇති බවත් වටහාගත හැකි ය. ඒ අනුව පරිසර වන්දනයේ දර්ශනය, සොබා දහමේ චිකිත්සාව වැනි විෂය පථයන් විමසුම හා යොමුව වඩා වැදගත් වනු ඇත. එසේ වුව ද අද්‍යතන සමාජය සොබාදහම පැවැත්මේ වටිනාකම පිළිබඳ අනවබෝධය මත හෝ විපරිත වූ සමාජ, ආර්ථික තත්ත්වය මත හෝ නොසලකා හැර ඇත. එහෙත් මෙම විමසුම මඟින් නූතන මිනිසාට ඒ පිළිබඳ තවදුරටත් සිතා බැලීමට අවධාරණය කිරීම වැදගත් වේ.

## 4. නිගමන හා නිර්දේශ

කිසියම් නිශ්චිත භූමියක වසන ජනයා තම ජීවන පැවැත්ම උදෙසා පරිසරානුබද්ධ ජීවිතයේ වැදගත්කම හඳුනා ගනී. එහි දී මානවයාගේ මූලික අවශ්‍යතා වන ආහාර, ඇඳුම් පැළඳුම්, වාසස්ථාන, ආරක්ෂාව ආදියට පරිසර සාධකවල අවශ්‍යතාව අවබෝධ කොට ඇත. මේ හැරුණු කොට වත්මනෙහි විශ්‍රුත විද්‍යා විෂය පරාසයක බන්ධුතාව මත පරිසර විද්‍යාව සංකීර්ණ විෂය ක්ෂේත්‍රයක් වෙයි. එකී පරිසර සාධක මෙන් ම පරිසර ක්‍රියාකාරීත්ත්ව පිළිබඳ ප්‍රත්‍යක්ෂ වුව ද, ප්‍රත්‍යක්ෂ නොවූව ද, ඊට ගරුත්වයක් දැක්වූ හ. එහි දී පරිසර පැවැත්ම තම ජීවිතයට අත්‍යාවශ්‍ය වූ බැවින් ඒ හා සම්බන්ධ සාරධර්ම පද්ධතියක් ගොඩනඟා ගත් හ. එහි ප්‍රතිඵලයක් ලෙස ස්වභාවධර්මයේ වස්තූන් හා සිද්ධීන් අපූර්වත්වයක් සේ සලකා ඊට අධිමානුෂිකත්වයක් පවරා පූජනීයත්වයට පත්කොට ඇත. ඒ අතර ඊට උත්තරීතරත්වයක් ප්‍රකාශනයේ දී දේවත්ව ආරෝපණය කළ හ. ඒ මත බිහි වූ පරිසරානුබද්ධ ඇදහිලි විශ්වාසයන්හි ප්‍රභවය කවදා කෙසේ ඇති වූයේ දැයි නිශ්චිතව සඳහන් කිරීම අපහසු ය. එහෙත් කාලානුරූපව මිනිසාගේ බුද්ධිය පරිසරය පිළිබඳ අත්දැකීම් සහිත දැනුම මත බිහි වූ ජන වන්දනා විධි දෙකක් හඳුනාගන්නට විය. ඒ අනුව පරිසරය පිළිබඳ මානව සංජානනය මත හා සංජානනයෙන් තොර වූ විශ්වාස පදනම් වූ වශයෙනි.

ඒ අනුව ප්‍රාථමික පරිසර වන්දනයේ ප්‍රභවයට නව මතවාදයක් වන එය මානවයාගේ දැනුම හා භාවිතය මත දෙ ආකාරයකට බිහිව ඇති බව නිරීක්ෂණය විය. පරිසරයත් මිනිසාත් අතර පවත්නා අන්තර් සම්බන්ධතා මෙන්ම පරිසර වන්දනයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු පහතරට ශාන්තිකර්මවල පරිසර බද්ධ වත්පිළිවෙත් කෙරෙහි වැදගත් බව දැක්විය යුතු ය. ක්‍රමිකව ආගමික දේශපාලන ආර්ථික තත්ත්ව මත ඇති වූ සංස්කෘතික විපර්යාස මාතෘකාගත ඇදහිලි විශ්වාස කෙරෙහි ද බලපාන්නට වී ඇත. ලෝකයේ භූ, දේශගුණ, සංස්කෘතික හා සමාජ විවිධත්ව මත

පරිසර සංස්කෘතික රීති විමසී ය. එමෙන් ම මෙරට ප්‍රාථමික හා ප්‍රාග් බෞද්ධ යුගයේ සිට බෞද්ධ ආගමික හා භාරතීය ආභාස පහතරට ශාන්තිකර්ම පරිසර වත්පිළිවෙත් මගින් පිළිබිඹු කෙරේ.

ආගමික සම්මිශ්‍රණයෙන් විකාශය වූ ලක්දිව ප්‍රචලිත බෝධි පූජා, පිරිත් පින්කම, නානුමුරය ආදී පරිසර බද්ධ වත්පිළිවෙත් මෙහි දී වඩා වැදගත් විය. මේ හා සමාන වත්පිළිවෙත් පහතරට ශාන්තිකර්මවලද නිරූපණය වන අතර ඒවා ජන ඇදහිලිවලට බලපෑ සමාජ, සංස්කෘතික, ආගමික හා මනෝ විද්‍යාත්මක දෘෂ්ටිය වෘක්ෂ ජලය හා භූමිය ආදිය මඟින් අවධානයට ලක් විය. එකී වස්තූන් පිළිබඳ ගොඩනඟා ගත් උපත් කතා, පුරා කතා මගින් ජනශ්‍රැති, ආගමික, ඓතිහාසික හා සෞන්දර්යාත්මක සැබෑදියාව මිනිසා පරිසරය පිළිබඳ දැක්වූ සවිඥ්ඥනය ප්‍රකාශ කෙරේ. එමෙන් ම එකී පරිසර සාධක භාවිතයේ දී සිදු කෙරෙන වත්පිළිවෙත් තිරසර පරිසරයක් උදෙසා උපස්ථම්භය වන බව පැහැදිලි ය.

වෘක්ෂලතා, ජලය, භූමිය මූලික වූ සිරිත් චාරිත්‍ර මඟින් ඊට ආගමික ආරෝපණයක් ලබාදීම මානව, සමාජ විද්‍යා අංශයෙන් ද එහි ඇති දාර්ශනික පසුබිම ද මෙහි දී වැදගත් කොට සැලකේ. එකී පරමාර්ථ මුදුන් පමුණුවාගැනීමට අදාළ ශාන්තිකර්මයට සුවිශේෂ වූ ක්‍රියාවලි පද්ධතියක් ඇඳුරන් අතර පවතින බව හඳුනා ගතිමු. ශාන්තිකර්මයට උචිත භූමියක් තෝරාගැනීම, ජලය පරිහරණය, වෘක්ෂලතා භාවිතය පිළිබඳ සිරිත් විරිත්වලින් යුතු නියමාවලියක් පිළිබිඹු කිරීම එකී වස්තු කෙරෙහි මානව ධර්මතා ගොඩනැඟීමට පිටුබලයක් වනු නොඅනුමාන ය. ඒ අනුව පහතරට ශාන්තිකර්ම පද්ධතිය මඟින් ද පරිසරානුබද්ධ ආගමික, සංස්කෘතික, සමාජ, දර්ශනය හඳුනා ගැනීමත් එය පරිසරය පැවැත්මට උපස්ථම්භය වන ආකාරය මනාව අවබෝධයට ලක් කෙරෙනු ඇත.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අදිකාරම්, ඊ.ඩබ්ලිව්. (1975) *ස්වභාවධර්මයා සහ මනුෂ්‍යයා*, මාර්ටින් වික්‍රමසිංහ කොග්ගල මහා ප්‍රාඥයා, තිසර මුණාලය

අමරසේකර, දයා (2000) *ආගම සහ අභිචාර පිළිබඳ සමාජ හා මානව විද්‍යාත්මක හැඳින්වීමක්*, සම්භාෂා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, කොළඹ

ආයසීවංශ, එච්. ඩී. එච්. (1958) *පෙරදිග චිත්‍ර හා නෘත්‍ය කලා,* සීමාසහිත ඇම් ඩී ගුණසේන සහ සමාගම, කොළඹ

අරියධම්ම හිමි, එල්. (2018) *මහාසමය සූත්‍රය,* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

එඩ්මන්ඩ්, කේ. බී. ඒ. (2004) *නූතන කලාවේ දාර්ශනික මුහුණුවර*, සංස්: මුදියන්සේ දිසානායක, සංඛ, ජූලි-දෙසැම්බර් කලාපය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

එදිරිසිංහ, ඩී. (2001) *දාර්ශනික විමර්ශන*, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල

කුලතිලක, සී. ද. ඇස්. (1996) *සංගීත සම්භවය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

ගමගේ, ඩී. (1998) *පරිසරයට ආදරය කරන සාහිත්‍යයක් අවශ්‍යයි*, සංස්: සමුද්‍ර වෙත්තසිංහ, නව සාහිත්‍ය සංවාද, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ගම්ලත්, එස්. (1995) *ඓතිහාසික භෞතික වාදය හා කලාව*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

තිස්ස හිමි, සුධම්ම (2002) *පරිසර ගැටලුව සහ පරිසර සංරක්ෂණය*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

දහනායක, අනුර පී., පොන්නම්පෙරුම, සිරි (1970) *මානුෂ භූගෝල විද්‍යාව*, ඇම්.ඩී ගුණසේන සහ සමාගම

පැට්රික්, එන්. (2000) *කුමාර සම්භවය,* (සංස්.) ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ

ප්‍රේමදාස, ඒ. (2001) *භෞතික පරිසරය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ

බෂාම්, ඒ. එල්. (1962) *අසිරිමත් ඉන්දියාව*, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ

බුද්ධදාස, ආර්. (1960) *චරක සංහිතාව*, රාජ්‍ය භාශා දෙපාර්තමේන්තුව, කොළඹ

මාරසිංහ, එම්. එම්. ජේ.(2013) *බුදු දහම සහ බුද්ධාගම*, සරස පකාශකයෝ, කොළඹ

මීගස්කුඹුර, පි.බී. (1995) *සිරිලක වැදි ජන පුරාණය*, පිනිදිය ප්‍රකාශකයෝ

මේධානන්ද හිමි, ඩී. (2000) *බුදුදහම, මිනිසා සහ සමාජය*, සංස්: රත්නපාල, සම්භාෂා, අධ්‍යාපන අමාත්‍යංශය.

රත්නපාල, ඊ. ඇම්. (1993) *කළු ගග අසබඩ*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

රත්නපාල, ඊ. ඇම්. (2003) *ලංකාවේ වැද්දෝ*, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල

රොලින්සන්. (1967) *භාරතීය සංස්කෘතික ඉතිහාසය*, සංස්: පඤ්ඤානන්ද වෙදගේ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාතමේන්තුව

විජයරත්න, එම්. එස්. (1995) *පරිසර විද්‍යාව*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

විජේරත්න, ඒ. (1998) *සොබා දහම ඇසුරින් සකස් වූ ප්‍රාග් ඓතිහාසික යුගයේ ඇදහිලි හා විශ්වාස* සංස්: ගාමිණී දැලබණ්ඩාර, ආර්. ඩබ්ලිව්. රාජපක්ෂ, සම්භාව්‍ය ශාස්තීය ලිපි සංග්‍රහය 3, අභය මුද්‍රණ

විමලවංස හිමි, බී. (1961) *වෛදික සංස්කෘතිය හා කලාව*, සංස්: තේරිපැහැ සෝමානන්ද, තරංග

ශ්‍රී රේවත, බී. (2001) *ශබ්දාර්ථ රත්නාකරය හෙවත් සිංහල මහා අකාරාදිය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

ශ්‍රී සුමංගල හිමි, බීථ (1994) *සිංහල මහාවංශය*, රත්න පොත් ප්‍රකාශකයෝ

සාරානන්ද හිමි, එළමල්දෙණියේ (2016) *පරිසර සංරණය පිළිබඳ බෞද්ධ චින්තනය*, සී/ස ඇස්. ගොඩගේ

සෝමසුන්දර, දයානන්ද (2010) *ලෝකයේ පැරණි ශිෂ්ටාචාරයන් අතර ලංකාවට හිමි තැන*, ආදිවාසි හෙළ උරුමයන්, කොළඹ